**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 2013**

**-----------------------------------------------------**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනවල ජාත්‍යන්තර විගණන ප්‍රමිතින් (අයිඑස්එස්ඒ අයි 1000 -1810 ) වලට අනුරූපී ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු

කිරීම් වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංාකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන මත අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ශේෂ පත්‍ර දිනට යහපත් ධාවන තත්ත්වයේ පැවති රු.31,226,680 ක පිරිවැයකට මිලදී ගෙන සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු වාහන 13 ක් ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද, වර්ෂ කිහිපයකට පෙර විදේශ අරමුදල් ව්‍යාපෘතියකින් ලැබී තිබුණු වාහන හතරක් අගය කර ගිණුම් වලට ගෙන නොතිබුණු අතර මෙම වාහන වල හිමිකාරිත්වය මණ්ඩලය වෙතට මාරු කර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.79,988 ක් වූ උපචිත වියදම් සඳහා වෙන්කිරීම්, මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟය එම මුදලින් අඩුවෙන් පෙන්වා තිබුණි.

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මණ්ඩලයේ ණය ගැති කළමනාකරණය පිළිබඳව පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු රු.8,902,798 ක් වූ ණයගැතියන් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු රු.9,078,050 ක් වූ ණයගැති විස්තරාත්මක උපලේඛනය සමඟ එකඟ නොවීය.

(ආ) මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණු එකතුව රු. 1,913,430 ක් වූ අත්තිකාරම් තුළ වටිනාකම රු.1,780,060 ක් වූ වර්ෂ 10 කට වැඩි කාලයක් අයකර ගෙන නොතිබුණු ශේෂ 16 ක් ද ඇතුළත්ව තිබුණි.

(ඇ) වටිනාකම රු.356,813 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් වයස් විශ්ලේෂණයන් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, බාහිර ආයතන 10 ක් වෙන්කරන ලද

රු.295,313 ක් වටිනා තැන්පතු වලට අදාල ලැබීම් පත්‍ර, මණ්ඩලය සතුව නොතිබුණු අතර ඒ අනුව එම තැන්පතු මුදල් බවට පත්කර ගැනීමේ අවදානමක් තිබෙන බව පෙන්වයි.

(ඇ) වර්ෂය අවසානයට පැවති රු.6,282,645 ක්වූ බැංකු ශේෂ සම්බන්ධයෙන් වූ ශේෂ තහවුරු කිරීම් විගණනය සඳහා කැඳවා නොතිබුණි.

(ඉ) මණ්ඩලය, 2011 දෙසැම්බර් මාසයේදී ගණකාධිකාරිවරියකගේ සේවය හමාර කර තිබුණු අතර, සේවය හමාර කර තිබුණු දින සිට හිඟව පැවති රු.161,554 ක් වූ ඇයගේ ණය ශේෂය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ශේෂ පත්‍ර දිනට පැවති රු.50,835,028 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට එකඟ නොවීම

පහත සඳහන් එකඟ නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2007 අංක 54 දරන මත් ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයින් පිළිබඳ (ප්‍රතිකාරක හා පුනරුත්ථාපන) පනතේ 4(3) වගන්තිය | පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන වල සිදුකරන ලබන ප්‍රතිකාරවල සාර්ථකත්වය සම්බන්ධයෙන් ප්‍රතිකාර මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කළ යුතු කාලීන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි - 109(1)(ආ) | සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා දෙකකදී මණ්ඩලයේ වාහන අනතුරට පත්වී තිබුණු නමුත් මණ්ඩලයට අයත් වත්කම් වලට සිදුවූ හානි පිළිබඳව විගණකාධිපති වෙත වාර්තාකර |

| | |
|---|---|
| | නොතිබුණි. |
| 371(2)(ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 16 කදී ප්‍රදානය කර තිබුණු එකතුව රු.299,000 ක් වූ අත්තිකාරම් අතුරින් සියයට 45.52 ක් හෝ රු.136,110 ක් අදාල කර කාර්යය සඳහා භාවිතා නොකර මුදලින් නිරවුල් කර තිබුණි. හිලව් නොකළ ශේෂ දින 30-98 ක කාලයක් මණ්ඩලයේ සේවකයන් අත පැවතුණි. |
| 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.3.1(iii) වගන්තිය | ජොෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුව හිමි වේ. කෙසේ වුවද මණ්ඩලයේ අළුතින් බඳවාගත් සහකාර අධ්‍යක්ෂවරුන්ට නිල වාහන පහසුකම් ප්‍රදානය කර තිබුණු අතර චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව ඔවුන්ගේ නිවාස වල එම වාහන රාත්‍රි කාලයේ ගාල් කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වලින් වූ රු.6,446,755 ක් වූ හිඟය ඉකුත් වර්ෂයේ වූ රු.15,013,481 ක් වූ අනුරූපී හිඟය සමඟ සැසඳීමේදී පෙනී යන්නේ හිඟය රු.8,566,726 කින් අඩුවී තිබුණු බවය. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිර්දේශය පරිදි රු.1,335,034 ක් වූ ණය හිමි ශේෂය නැවත ආදායමට ගෙන තිබීම සහ විදේශ අරමුදල් ව්‍යාපෘතියකින් මාරු කරන ලද වාහනයක් විකිණීමෙන් ලැබුණු රු.1,777,777 ක් වූ මුදල ආදායමට ගෙන තිබීම සමාලෝචිත වර්ෂයේ හිඟය අඩුවීමට බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

(අ) මණ්ඩලයේ පර්යේෂණ ඒකකයේ 2013 වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව අනුව, මෑත කාලයේදී මත් ද්‍රව්‍ය සම්බන්ධ කරුණු මත අත් අඩංගුවට පත්වූ පුද්ගලයින් සංඛ්‍යාව පහත සඳහන් පරිදි කැපීපෙනෙන ලෙස ඉහළ ගොස් තිබුණි.

| වර්ෂය | අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | ගැහැණු | පිරිමි | මුළු සංඛ්‍යාව |
| 2010 | 304 | 29,492 | 29,796 |
| 2011 | 359 | 42,144 | 42,503 |
| 2012 | 706 | 47,220 | 47,926 |

තවද, පොලිස් මත් ද්‍රව්‍ය නායක කාර්යාංශය විසින් ප්‍රසිද්ධ කරන ලද තොරතුරු අනුව, 2013 අගෝස්තු 30 දින හෙරොයින් කි. ග්‍රෑම් 261 ක විශාල තොගයක් අත්අඩංගුවට ගැනීම ඇතුළත්ව 2013 වර්ෂයේදී අවස්ථා 46 කදී හෙරොයින් කි.ග්‍රෑම් 280 ක් අත්අඩංගුවට ගෙන තිබුණි. රට තුළ, නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම් වර්ධනයේ වේගවත් ප්‍රවනතාවයට එරෙහිව බලවත් ප්‍රතිපත්ති රාමුවක අවශ්‍යතාවය මෙයින් පෙන්නුම් කරනු ලබයි.

(ආ) මණ්ඩලය, සේවා මධ්‍යස්ථාන හතරක් හරහා මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමට සම්බන්ධ වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සේවා මධ්‍යස්ථාන වලින් නේවාසික ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින් සම්බන්ධව සහ සමාලෝචිත වර්ෂයේදී දරන ලද වියදම ඉකුත් වර්ෂ දෙක සමඟ සසඳා පහත දැක්වේ.

| සේවා මධ්‍යස්ථානය | නේවාසික ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන් සංඛ්‍යාව | | | ප්‍රතිකාර ලබාගත් පුද්ගලයින්ගේ මාසික සාමාන්‍යය | මුළු පිරිවැය (කාර්ය මණ්ඩල වැටුප් හැර) | පුද්ගලයෙක් සඳහා මාසික සාමාන්‍ය පිරිවැය |
|---|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2013** | **2013** | **2013** |
| | | | | | රු. | රු. |
| ඌරාපොළ | 315 | 255 | 390 | 33 | 4,738,867 | 11,966 |
| තලංගම | 326 | 340 | 513 | 43 | 4,986,098 | 9,662 |
| නුවර | 165 | 155 | 82 | 7 | 2,010,909 | 23,939 |
| ගාල්ල | 158 | 134 | 207 | 17 | 4,025,884 | 19,735 |
| එකතුව | 964 | 884 | 1,192 | | 15,761,758 | |

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේදී පුද්ගලයින් 884 දෙනෙකු සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලයන් 1,192 ක් වෙත නේවාසික ප්‍රතිකාර ලබාදී තිබුණු නමුත් මහනුවර පිහිටි මධ්‍යස්ථානයේ 2012 වර්ෂයේදී ප්‍රතිකාර කළ පුද්ගලයන් 155 සමඟ සැසඳීමේදී පුද්ගලයින් 82 ක් වෙත ප්‍රතිකාර කිරීමෙන් පෙනීගොස් තිබුණේ 2013 වර්ෂයේදී එක් පුද්ගලයෙක් සඳහා රු.23,939 ක ඉහළ සාමාන්‍ය පිරිවැයක් වු බවය.

(ii) නේවාසික ප්‍රතිකාර වලට අමතරව, මණ්ඩලය මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වුවන් සඳහා උපදේශන සේවා සපයනු ලබයි. මේ සම්බන්ධයෙන් 2012 වර්ෂයේදී

පුද්ගලයන් 1,463 දෙනෙක් සමඟ සැසඳීමේදී 2013 වර්ෂයේදී පුද්ගලයන් 2,021 දෙනෙක් වෙත උපදේශන සේවා ලබාදී තිබුණි.

(iii) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන පුනරුත්ථාපන මධ්‍යස්ථාන හතරට අමතරව වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් වෙනත් පුනරුත්ථාපන මධ්‍යස්ථාන 12 ක්ද මෙහෙයවා තිබුණි. කෙසේ වෙතත්, මෙම මධ්‍යස්ථාන වලින් ප්‍රතිකාර ලැබූ පුද්ගලයින් සම්බන්ධ තොරතුරු විගණනයට ලැබී නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩුදුන් කරුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 ඔක්තෝබර් 13 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ජීර්එන්/ඩීඑම්එස්/ ඊ3 / 05/04/006/01 දරන ලිපිය අනුව මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ තනතුර, අධ්‍යක්ෂ ජනරාල් තනතුර වශයෙන් ඔසවා තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු බඳවා ගැනීමේ පරිපාටිය අනුව විධායක අධ්‍යක්ෂ තනතුර අහෝසි කර තිබුණි. කෙසේ වෙතත් 2008 ජුලි 01 දින සිට වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයා තත්ත්වයෙන් පහළ දමා විධායක අධ්‍යක්ෂ තනතුරට ආපසු යවන බව දන්වා සභාපතිතුමිය 2013 සැප්තැම්බර් 20 දින ලිපියක් නිකුත් කර තිබුණි. විධායක අධ්‍යක්ෂවරයා, මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳව මණ්ඩලයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

(ආ) මණ්ඩලයේ කාර්යාල සඳහා ආරක්ෂක සේවාවන්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් නිලධාරින් විසින් සපයනු ලබයි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයට රු.504,000 ක අතිරේක පිරිවැයක් දරා සභාපතිතුමියගේ පෞද්ගලික නිවාස සඳහා ආරක්ෂක සේවාවන් වෙනත් ආරක්ෂක ආයතනයකින් ලබාගෙන තිබුණි.

## 4.3 මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ජ්එස් එච්71 ව්‍යාපෘතිය නම්වූ වෙනත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන වෙතින් රු.685,540 ක මුදලක් 2013 වර්ෂයේදී මණ්ඩලයට ලැබී තිබුණු අතර ඉන් රු.237,000 ක මුදලක් සම්බන්ධීකරණ නිලධාරියකුගේ සහ වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වැටුප් සඳහා දරා තිබුණි. කෙසේ වෙතත් , සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ව්‍යාපෘති කාර්යයක් සිදුකර නොතිබුණි.

(ආ) තවද රු.3,088,750 ක මුදලක් ලැබී තිබුණු අතර ඉන් රු.106,147 ක මුදලක් පමණක් එක්සත් ජාතීන්ගේ මත් ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාල විසින් සංවිධානය කර තිබුණු දූෂණ සම්බන්ධ පුහුණු වැඩ සටහන් සඳහා වැයකර තිබුණි. එම කරුණු හැර සමාලෝචිත වර්ෂය තුළදී වෙනත් කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අරමුදල් සපයා තිබුණු වෙනත් වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.721,076 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වෙතත්, වැඩ සටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීමට හැකිවන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා එම වැඩ සටහන්වල කාර්ය සාධන වාර්තා විගණනයට ලැබී නොතිබුණි.

## 4.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ ප්‍රධාන තනතුරු 07 ක හා ද්විතියික මට්ටමේ තනතුරු 62 ක පුරප්පාඩු සහිතව ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය විය. සමාලෝචිත

වර්ෂය තුළදී රු.587,372 ක පිරිවැයක් දරමින් සහකාර අධ්‍යක්ෂ මුදල් , අභ්‍යන්තර විගණක, පරිපාලන නිලධාරි , පුස්තකාලාධිපති සහ වෙනත් මාණ්ඩලික තනතුරු සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පලකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එම පුරප්පාඩු පුරවා නොතිබුණි. 2014 අප්‍රේල් 02 දින එම තනතුරු සඳහා පුද්ගලයින් බඳවාගැනීමට තවත් දැන්වීමක් ප්‍රසිද්ධ කර තිබුණි.

(ආ) ස්ථිර ලෙස තනතුරු පිරවීමට පියවර නොගෙන, පැවරුම් පදනම මත පුද්ගලයින් 43 දෙනෙකුගේ සේවය අඛණ්ඩව ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

----------------------------------------

### 5.1 දැක්ම

------

මණ්ඩලයේ දැක්ම, 2020 වර්ෂය වන විට මත් ද්‍රව්‍ය වලින් තොර රටක් බවට පත් කිරීම වශයෙන් විස්තර කිරීමෙන් පෙනීයන්නේ එය, කාලය හා බැඳුණු පටු ලෙස අර්ථ කථනය කර තිබුණු බවය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව තිබුණු පියවරයන් සම්බන්ධ සත්‍ය ක්‍රියාකාරිත්වය මැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණු අතර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම නිසි පරිදි, කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

මණ්ඩලය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ප්‍රසම්පාදන පිරිවැය, විශාල වශයෙන් එහි ඇස්තමේන්තුගත මුදල ඉක්මවා තිබුණි. පර්යේෂණාගාර උපකරණ, පුහුණු කිරීම් ද්‍රව්‍ය, නිල ඇඳුම් යනාදිය ප්‍රසම්පාදනය සඳහා වූ සත්‍ය වියදම , ඇස්තමේන්තුගත මුදලට වඩා සියයට 60 කින් ඉක්මවා තිබුණු අතර පිරිවැය හා උපකරණ සඳහා වූ වියදම සියයට 125 කින් ඇස්තමේන්තුගත මුදල ඉක්මවා තිබුණි.

**5.4 අභ්‍යන්තර විගණනය**

**---------------------**

මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් වෙනම පිහිටුවා නොතිබුණු අතර අදාල අභ්‍යන්තර විගණන කටයුතු, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකර තිබුණි. කෙසේ වුවද, අනුමැතිය සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහන් හෝ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.5 අයවැයගත පාලනය**

**---------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා අතර සියයට 10 සිට සියයට 100 දක්වා වූ විචලතාවයක් නිරීක්ෂණය විය. ඉන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන උපකරණයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

**-----------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිතුමියගේ අවධානය සඳහා යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

(අ) ගිණුම්කරණය

(ආ) පුනරුත්ථාපන මධ්‍යස්ථානවල කාර්යසාධනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) තොග පාලනය